# 17 වංකගිරි අරණේ දී

සිංහල සාහිත්‍යයටත්, දේශීය නාට්‍ය කලාවටත්, අනුපමේය සේවාවක් කළ මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ "වෙස්සන්තර ගීතාංග නාටකයෙන්" උපුටා ගත් කොටසක් මේ පාඩමට ඇතුළත් වේ. වෙස්සන්තර රජු, මන්ද්‍රිබිසව, ජාලිය ක්‍රිෂ්ණජිනා දරුදෙදෙනා සමඟ වංකගිරියට පිටත් ව ගොස් එහි අසපුවේ ගත කරන අවස්ථාව මේ කොටසින් නිරූපිත ය.

මේ නාට්‍යයට වස්තුවිෂය වී ඇත්තේ පන්සිය පනස් ජාතක පොතෙහි එන "වෙස්සන්තර ජාතක කථාව යි."

නාට්‍ය රස විඳීම හා නාට්‍ය නිර්මාණ කුසලතා වර්ධනය කිරීමත්, වර්තමාන නාට්‍ය නිර්මාණවල භාෂා රටා සම්ප්‍රදායන් හා සුවිශේෂතා හැඳින ගැනීමත් මේ පාඩමෙන් අපේක්ෂිත ය.

## 3 ජවනිකාව

(වෙස්සන්තර රජ, මන්ද්‍රි දේවිය, වංකගිරියේ අසපුව)

**වෙස්සන්තර** : (දුර්මුඛ විලාසයක් පාමින් ඉන්නා මන්ද්‍රි දේවිය වෙතට යමින්) සොඳුර අද පලවැල නෙළන්න යන්නෙ නැද් ද? ගෙනාපුවා ඇති වෙන්න තියෙනව ද දරුවන්ට දවාලට කන්න?

**මන්ද්‍රි** : ගෙනාපුව නං නෑ ස්වාමීනි, මම යන්න ඕන. ඒත් මගේ හිත ඉඩ දෙන්නේ නෑ අද යන්න. ඒකයි මෙච්චර වෙලා බලන් ඉන්නේ.

**වෙස්සන්තර** : ඇයි සොඳුර, ඔබට මුකුත් අපහසුවක් දැනෙනව ද ඇඟට ? එහෙම නම් වැඩිය හොඳයි අද නොගිහින් ඉන්න එක. ඉරත් මුදුනට ඇවිල්ලා.

**මන්ද්‍රි** : (නැගී සිට) ඔව්, පමා වුණා තමයි. නොගිහිනුත් බෑ නේ. දරුවෝ බඩගින්නේ තියන්න පුළුවනැයි ? ඇගේ අමාරුවක් නො වේ. මගේ හිත කියනවා යන්න එපයි කියලා.

**වෙස්සන්තර** : හැමදාම පලවැල නෙළන්නයි කියලා අව් කුටකේ කැලෑවේ ඇවිදින එක ලේසි පහසු වැඩක් නොවේ. මං දන්නවා ඇගේ වෙහෙස හින්ද

තමයි හිත ඔහොම කියන්නේ.

**මන්ද්‍රි** : නෑ, ඒක නෙවේ, ස්වාමිනි, ඊයේ රෑ මං නපුරු හීනයක් දුටුව. ඒකෙනුයි මගේ හිත කැලඹිලා තියෙන්නෙ.

**වෙස්සන්තර** : මොකක්ද ඒ ?

**මන්ද්‍රි** : කවුද කළු මිනිහෙක් ඇවිත් මට මුව නොසෑහෙන්න බැණලා මගේ කොණ්ඩෙන් ඇදලා මාව බිම හෙළලා, මගේ ඇස් දෙක උගුල්ලලා, මගේ දෑත කපලා, මගේ හදවත උදුරාගෙන ලේ පෙරෙද්දී ඇරන් ගියා. භයානක පෙනුමක් ඇති මිනිහෙක්, රතු සළුවක් හැඳගෙන තව රතු සළුවක් කරේ ලාගෙන, කනේ රත් මල් පැළඳ ගෙනයි හිටියෙ. කඩුවකුත් අමෝරාගෙන මා වෙතට ආවා. අපෝ මං බය වෙච්ච තරම්. මතක් වෙනකොටත් මගේ පපුව ගැහෙනවා.

**වෙස්සන්තර** : සොඳුර, ඔබ මාත් එක්ක ඇවිදින් මෙච්චර කාලයක් තිස්සේ පලවැල කමින්, දඬු මැස්සේ නිදා ගනිමින් ගත කරපු කටුක ජීවිතයෙන් සරීරේ හෙම්බත් වෙලා. ඒකයි ඔබට මෙහෙම නපුරු හීන පෙනෙන්නේ. ඒ ගැන හිතට තැවුල් ගන්න එපා.

**මන්ද්‍රි** : (හඬ නගා) දරුවෙනි, ජාලිය! කෘෂ්ණජිනා! නුඹල කොහේ ද? මෙහාට එන්න පොඩ්ඩකට. (දරුවෝ එති.) මොකද කරන්නෙ ඔහේ ඉඳන් ?

**ජාලිය** : අපි මුව පැටියව දොළ ගාවට ගෙන ගියා අම්මේ, උෟට වතුර පොවන්න. උෟ හරි තිබහෙන් ඉඳලා තියෙන්නේ.

**මන්ද්‍රි** : උෟට තිබහ නම් උෟ අම්මගෙන් කිරි බෝවි. කෝ මුව දෙන නැද්ද ඔහේ ?

**කෘෂ්ණා** : මුව දෙන කිරි දීලා නෑ පැටියට අද උදේ අම්මේ.

**මන්ද්‍රි** : හොඳයි, ඒකට කමක් නෑ. මම දැන් යනවා පලවැල නෙළාගෙන එන්න. වැඩිය ඈතට යන්න එපා හොඳේ ? අප්පච්චිට පේන තෙක් මානෙක ඉන්න ඕන. ඇහුණ ද?

**කෘෂ්ණා** : ඇයි, අම්මා අද හුඟක් ඈතට යනව ද ?

**මන්ද්‍රි** : නෑ, මම යන්නෙ නෑ ඈත. මම එනවා වෙනදටත් වැඩිය කලියෙන්. නුඹලා අද පරිස්සම් වෙන්න ඕන. මට නුඹලා ගැන බයයි.

**ජාලිය** : ඇයි අම්මේ අද අමුතුවෙන් අපි ගැන බය ? අපි කවදාටත් අම්ම එන කල් සෙල්ලම් කර කර ඉන්නවනෙ.

**මන්ද්‍රි** : ගඟට යන්න එපා. ගස් නගින්න එපා. ඇහුණ ද ? මේ කිට්ටුවෙන් ම ඉන්න ඕන. ඉඳලා හිටලා ඇවිල්ලා අප්පච්චි බලලා යන්න. අප්පච්චිත් එක්ක කතා කරන්න එපා, අප්පච්චි භාවනා කරනවා නම්, ජාලිය පුතා, ඇහුණනෙ මං කියපු දේ ? නංගීව බලා ගන්න ඕන. දඟ කරන්න දෙන්න එපා. (දරුවන් දෙදෙන සිප වැළඳගෙන පිටතට යවයි. අනතුරු ව ඈ ස්වාමියාගේ පාමුල වැඳ වැටී සමු ගනී. ඉක්බිති ව ඈ ගායනා කරයි.)

නෑ සියෝ නොමැත මේ කතරේ මට
සිටින්නේ මේ දරු දෙදෙනා පමණයි
උන් උදෙසා ය මේ දුබල පණ නල
පපුව පතුළෙ මා රඳවා ඉන්නේ
උන්ගේ හුස්මෙන් හුස්ම හෙළමි මම
උන්හට නපුරක් වුව හොත් හිමි සඳ
මාගේ කාය ද බිඳේ ය එවිගස

(පැස හා කරුව අතට ගෙන)

අරක් ගත් මේ කැලෑ පෙදෙසට
සියලු දෙවියනි දේවතාවෙනි
ඔබට බාරයි මගේ දරුවෝ
හුදකලා ගැහැනියක වන මා
කෙරෙහි අනුකම්පාව දක්වා
සැම උවදුරුවලින් ගලවා
මගේ දරුවන් දෙවන් මා හට (නික්ම යයි)

**වෙස්සන්තර** : (අහකට) දේවි දුටු හීනය මගේ හිතටත් කරදරයි. මම ඇට එහෙම කිව්වට මොකද සිදු වෙන්න යන විපතක පෙර නිමිත්තක් දෝ කියලා මා තුළ තදබල සැකයක් තියෙනවා.
(ජාලිය දුවගෙන අවුත් පියාගේ තුරුල්ලට වැද වෙවුලන්නට පටන් ගනී) මොකද මේ, පුතේ? මොකද ඇඟ ඔක්කොම ගැහෙන්නේ ? කෝ නංගී ? (ජාලිය අත දිගු කරයි. කෘෂ්ණජිනා ද ත්‍රස්ත වූ විලාසයෙන් පිවිසේ.)

**ජාලිය** : යකෙකු වගේ මිනිහෙක් ඇවිත් අපි ව අල්ලා ගන්න හැදුවා, අප්පච්චි. අපේ පස්සෙන් එලවාගෙන ආවා. බය හිතෙනවා දැක්කම. දත් බොල්ලැයි. ඇස් වපරයි. කොණ්ඩෙ තඹ පාටයි. පා බකලයි.

වෙස්සන්තර : කවුද පුතේ එහෙම කෙනෙක් මෙහාට එන්නේ ? (පිටත බලයි) අර අතන හිටගෙන ඉන්න එක්කෙනා ද ? ඒ බ්‍රාහ්මණයෙක් නෙ.

ජාලිය : බ්‍රාහ්මණයෝ කියන්නේ ඔහොම අවලස්සන මිනිසුන්ට ද?

කෘෂ්ණා : ඔය තරම් නපුරු ද බ්‍රාහ්මණයො?

වෙස්සන්තර : නෑ, පුතේ, ඔහොම හිටියට නපුරු නෑ.

කෘෂ්ණා : එහෙනම් අපි ව එලවගෙන ආවේ ?

වෙස්සන්තර : එලවගෙන ආවා වෙන්න බෑ. උඹලට ආදරේට වඩාගන්න හදන්න ඇති. කොහොමටත්, බ්‍රාහ්මණයෙක් ගෙදරට ආව ම සත්කාර කරන්න ඕන. පෙර මඟට ගොහිල්ලා කෙණ්ඩි පිරිකර ඇරගෙන කැන්ද ගෙන එන්න ඕන. (ළමයි බමුණා එනු දැක අතික් පසින් දුව ගොස් සැඟවී සිටිති. බමුණා පිවිසේ.)

ජූජක : සැරද, ශ්‍රීමතාණෙනි ! ඔබ වැන්නකු දකින්නට ලැබුණු මේ මොහොත, අප විසින් කරන ලද මහත් පින් රැසක් පලදුන් දසාවක් ලෙසට අපට පෙනෙනවා. ඔබේ දර්ශනයෙන් මගේ දෑස් සනහාගෙන ආරෝග්‍ය විචාරීම පිණිස යි මම ආවෙ. මැසි මදුරුවන්ගෙන් පීඩා නැද්ද ? වන සතුන්ගෙන් හිංසා නැද්ද ? වන මුල් වන පලා ආදිය ප්‍රමාණවත් ව ලැබෙනවද ? තපසට බාධා නැද් ද ?

වෙස්සන්තර : පින්වත් බමුණ! ඔබ කියන එක දේකින් වත් අපට දුකක් නෑ. දානෙන් අඩුවක් නෑ. තපසට බාධා නෑ. ජනශූන්‍ය වූ මේ ප්‍රදේශයේ ඔබ වැන්නකු දකින්නට ලැබීම අපේ භාග්‍යයක් කොට අප සලකනවා. දුරු කතර ගෙවා ගෙන මේ ඝන කැලෑවට සැපත් වූ ඔබට ගමන් වෙහෙස බොහොම ඇති. අපි ගාව තියෙන මී පැණි වගේ රස පලතුරු අනුභව කොට අපේ පිරිසිදු සිසිල් පැන් පානය කොට, ඔබේ ගමන් විඩාව හැරගන්න. අද රාත්‍රියේ අසපුවේ ම නතර වෙන්න.

ජූජක : ඔබ ඉතා කරුණාවන්තයි, රජතුමනි, ඔබේ ආරාධනාව පරිදි අද රාත්‍රියෙහි අසපුවේ නතර වී ඔබ සමග පිළිසඳර කතාවෙන් කල් යවන්ට ඇත්නම් කෙතරම් භාග්‍යයක් ද! ඒත් වැඩ බහුල නිසා මේ වතාවෙ ඊට අවකාශයක් නෑ. උතුම් වූ ත්‍යාග ශීලය කරණ කොටගෙන ඔබතුමා ලබා ඇති කීර්ති නාමය දඹදිව ජනයාගේ තුඩ තුඩ පවතිනවා. ඔබතුමා බැහැ දැක යන්න ආවෙ ඒ නිසයි. ඔබතුමා මෙහේ වාසය කරන්නෙ හුදකලාව ද?

වෙස්සන්තර : නෑ, මගේ බිසවත් මා සමග තපස් රකිනවා. ඈ මේ වෙලාවෙ අසපුවේ

නෑ. පලවැල නෙලා එන්න වනයට ගියා. වැඩිය පමා නොවී ආපසු ඒවි. ඔබ දකින්න ලැබුණොත් ඇගේ සිතත් අතිශයින් ම පහන් වේවි. මෙවැනි ප්‍රදේශයක බ්‍රාහ්මණයින්ගෙ දර්ශනය දුර්ලභ යි.

**ජූජක** : (අහකට) ඉතා හිතකර යෝගයක් ලැබිලා තියෙන්නෙ. බිසව ආපසු එන්න ඉස්සර මගේ කාර්ය ඉෂ්ට කරගන්න ඕන. ඈ ආවොත් අකුල් හෙළනවා. (රජුට) ඔබතුමාගේ ශ්‍රේෂ්ඨ ගුණ වටහා ගන්න බැරිකමටයි වැසියො ඔබතුමා ව රජකමෙන් පහ කෙරුවේ. දැන් ඔවුන් පශ්චාත්තාප වෙනවා ඇති.

**වෙස්සන්තර** : යම් කෙනෙක් මගෙන් යමක් ඉල්ලුවොත් මම කවදාවත් නො දී ඉන්නේ නෑ. ඒක මගේ සිරිත. කෙනෙක් යම් දෙයක් ඉල්ලන්නේ ඒක වෙන විදිහකින් ලබා ගන්න බැරි නිසයි. යන්තම් වත් පුළුවන්කමක් තියෙනවා නම් මම ඒ ඉල්ලීම ඉෂ්ට කරනවා. ඒකෙන් ඒ තැනැත්තගෙ දොළ සංසිඳෙනවා. මටත් අප්‍රමාණ සැනසීමක් ලැබෙනවා.

**ජූජක** : අර මං එනකොට අසපුව ඉදිරියෙ සෙල්ලම් කර කර හිටියෙ ඔබතුමාගේ දරුවො වෙන්න ඇති.

**වෙස්සන්තර** : ඔව්, ඒ මගේ දුවයි පුතයි.

**ජූජක** : මං දැනගත්ත. හරි ම හුරතල් ළමයි. මට හරි ආදරේ හිතුණා, දැක්ක හැටියෙ ම, කෝ ඒ දෙන්න දැන් ?

**වෙස්සන්තර** : ඔහේ සෙල්ලම් කර කර ඇති. (හඬගාමින්) දරුවෙනි ! කොහේ ද නුඹලා? ඇවිත් මේ බ්‍රාහ්මණයාට ආචාර කරන්න. (මඳක් බලා සිට) ඔහොම තමයි සෙල්ලමට හිත ගියා ම.

**ජූජක** : මමත් පින් කරලා තිබුණා නම් එහෙම ළමයි දෙන්නෙකුගෙ පියෙක් වෙන්න ? මගේ බිරිඳටත් තියෙන ලොකුම සාංකාව ඒක තමයි. අපට ළමයි නෑ නෙ. ළමයෙක් දෙන්නෙක් හදාගන්න ඕනෙයි කියලා ඈ නිතර ම කියනවා. (රජ නිශ්ශබ්ද ව හිඳී) ඒ වුණත් ඕනෑ ම ළමයෙක් ඇරන් හදා ගන්න බැහැනෙ. ඉස්සෙල්ලා ළමයෙක් කෙරෙහි මාතෘ ප්‍රේමයක් පිතෘ ප්‍රේමයක් ඇති වෙන්න ඕනෑ. අනික, අනුන්ගෙ ළමයි කොහොම ද එහෙම ඉල්ලන්නෙ ?

**වෙස්සන්තර** : දරුවෙක් කිව්ව ම, මවකට, පියකුට තියෙන ලොකු ම වස්තුව නෙ.

**ජූජක** : රජතුමනි, මම බමුණෙක් වුණාට එක දෙයක් අවංක ව කියන්න ඕන. අපි බමුණන්ගෙ නරක සිරිතක් තියෙනවා. එනම් හිතෙන හිතෙන දේ ඉල්ලීම. මම එහෙම කෙනෙක් නො වේ. ඔබේ දරුවො කෙරෙහි දුටු වහා පිතෘ ප්‍රේමයක් මා තුළ ඇති වුණා. ඒ වුණත් මට පුළුවන් ද ඔවුන් ඉල්ලන්න ඔබෙන් ?

**වෙස්සන්තර** : (තමාටම) මගේ දාන පාරමිතාව මුදුන්පත් කර ගැනීමට ලැබුණු අපූරු අවස්ථාවක් වෙන්නත් පුළුවන් මේක. ඒ වුණත් මම හිතුවේ නෑ මට මේ සා මහත් පරිත්‍යාගයක් කරන්න වෙයි කියලා. (බමුණාට) බ්‍රාහ්මණය, ඔබේ හිතේ තියෙන අදහස මට කෙළින් ම කිව්වොත් වඩා හොඳයි.

**ජූජක** : ඒ දරුවො දෙන්න නම් ඉහත ආත්ම භවයෙ මගේ ම දරුවො වෙලා ඉන්න ඇතැයි කියලයි මට හිතෙන්නෙ. ඔවුන් ලබා ගන්න මට වාසනාවක් තිබුණොත් මට අනුන්ගෙ දෙයක් ලැබුණා වගෙ නෙවේ, මගේ ම දෙයක් ආපහු ලබා ගත්තා වගෙයි දැනෙන්නෙ.

**වෙස්සන්තර** : බ්‍රාහ්මණය, ඔබ මගේ දරුවන් ඉල්ලන්නේ නැතුව වෙන ඕන දෙයක් ඉල්ලන්න. මගේ හෘදයමාංස වුණත් කපලා දෙන්නම් ඔබ ඉල්ලනවා නම්. මාව වුණත් බාරගන්න වහල් බවට.

**කෘෂ්ණා** : (තම සොහොයුරා වැළඳ ගනිමින්) අනේ අයියෙ, මේ බමුණා නම් ඇවිත් තියෙන්නෙ අපිව ඉල්ලන්න තමයි. අප්පච්චි අපිව දේවි ද ?

**ජාලිය** : නෑ නංගියෙ, අප්පච්චි කොහොම ද එහෙම දෙයක් කරන්නෙ ? ඔය ඇහුණෙ නැද්ද කියනවා වෙන ඕන දෙයක් ඉල්ලන්න කියලා ?

**ජූජක** : ඔබතුමා දන්නව නෙ දරුවො කෙරෙහි මගේ සිත කොයි තරම් බැඳුණා ද කියලා, දරුවො නැතුව වෙන කොයි දේ ලැබුණත් මට සැනසෙන්න බෑ, රජතුමනි ඔබතුමා කිව්ව නේ ද යම් කෙනෙක් යමක් ඉල්ලුවොත් ඔබතුමා නො දී ඉන්නෙ නෑ කියලා ? මම දැන් ඉල්ලනවා ඔබතුමාගෙ දරුවන්. මං කැමතියි උන් වහා ම එක්ක යන්න.

**වෙස්සන්තර** : එහෙනම් මං කියන එක අහන්න, පොඩ්ඩකට අපි දරුවො දෙන්නත් අරන් මේ වනවාසයට ආවට මොකද උන්ට කිසි දුකක් දැනෙන්න ඉඩ තියල නොවේ උන් හදා වඩා ගත්තෙ. උන් ව වහා ම එක්ක ගියොත් උන්ට බඩගින්නෙ පිටත් වෙන්න වෙනවා. තව ටිකකින් උන්ගෙ මව ඒවි, උන්ට කන්න දේත් ඇරගෙන. ඈ ඇවිත් උන් නාවලා කවලා පොවලා ඉවර වුණා ම උන් ගෙනියන්න.

**කෘෂ්ණා** : ඔය, අප්පච්චි කියන්නෙ අපිව ගෙනියන්නෙයි කියලා.

**ජාලිය** : නෑ, අම්ම එනකල් ඉන්නලු. අම්ම ආවම බයක් නෑ. අපිව ගෙනියන්න දෙන්නෙ නෑ.

**කෘෂ්ණා** : ඇයි අම්මා මෙච්චර පමා වෙන්නෙ ?

**ජාලිය** : අප්පච්චිට නං අපිව ඕන නෑ. මට නම් බයයි. කෝකටත්, නංගියෙ, අපි ගොහිල්ලා කොහේ හරි හැංගෙමු ද ?
(දෙදෙනා නික්ම යති)



**ජූජක** : එහෙම බෑ රජතුමනි. මම කලිනුත් කිව්වනෙ පමා වෙන්න බෑ කියලා. වහා ම පිටත් වුණෙ නැත්නම් අපට අතරමග දී කරදර ඇති වෙනවා. ඔබතුමා දූන් දෙගිඩියාවෙන් වගේ කතා කරන්නෙ ඇයි.

**වෙස්සන්තර** : නෑ, දෙගිඩියාවක් නෑ මගෙ හිතේ. මම කිව්වෙ අම්ම එන කල් ඉන්න කියලා විතරයි. එහෙමත් බැරි නම්, දරුවන් ගෙනියන්න. මෙහෙම කරන්න එහෙනම්. ඉස්සෙල්ලා දරුවන් ව එක්කං යන්න සිවි රටට. ගෙනිහිල්ල මගේ දෙමවුපියන්ට පෙනෙන්න. ඒ අය දරුවන්ට කන්න බොන්න දීලා, ඇඳුම් පැළඳුම් එහෙමත් ලෑස්ති කරලා දීලා පිටත් කරාවි. දරුවො දැකපු සන්තෝසෙට ඔබට තෑගි බෝගත් දේවි.

**ජූජක** : රජතුමනි, ඔබ මට විහිළු කරනවා වගේ නේ ද ? සිවි රටට ළමයින් ගෙන ගියාම මාව හිරගෙයි දමාවි. නැත්නම් මාව මරාවි. මම ඒ තරම් මෝඩකමක් කරාවියි කියලා ඔබ හිතනවා වෙන්න බෑ.

**වෙස්සන්තර** : බමුණ, ඔබ ඔහොම කතා කරන්නෙ. වෙස්සන්තර කියන්නෙ කවුද කියලා දන්නෙ නැති හින්දයි. ඔබේ වචන අහලා මගේ හිත තදින් ම පෑරුණා එහෙනං දරුවො ඇරන් දැන් ම යන්න. ඔය ඔතන සෙල්ලම් කර කර හිටියෙ.
(ජූජකයා හති ලමින් කුපිත වේශයෙන් පිවිසේ.)

දරුවො දෙන්නා නැතිව මම කොහොම ද මේ වනයෙ වාසය කරන්නෙ? දේව් කියනවා වගේ, මට රජ සැපත් අමතක කරන්න පුළුවන් වුණේ උන් හින්දයි. ඒ වුණත් මං හිතන්න ඕන මා ගැන නෙවේ. සසර සැරි සරන විට, ලෙඩ රෝගවලට ගොදුරු වීම නිසා

හෝ අතුරු අන්තරාවලට හසු වීම නිසා හෝ තමන්ගෙ දරුවන් නැතිවෙලා අනේක වාරයක් වියෝ දුකට පත් වූ සහස්‍ර සංඛ්‍යාත පුහුදුන් ජනයා ගැනයි. ඔවුන් උදෙසා මගේ පුද්ගල සෝකය මම උහුලන්න ඕන. මම දුබල වෙන්න නරකයි මේ මොහොතෙ. මම පරාජය ලබන්නෙ නෑ. (ජූජකයා හති ලමින් කුපිත වේශයෙන් පිවිසේ)

**ජූජකයා** : මං දන්නවා දැන් වෙස්සන්තර කියන්නෙ කවුද කියලා. බොරු කීර්තියක් ලබා ගෙන තියෙන්නෙ, දන් දෙනව යි කියලා, ත්‍යාගශීලියි කියලා. පුදුමයක් යැ වැසියො රටින් එලවගත්තු එක. කරපු බොරු එළි වෙන්න ඇති. මටත් කළේ හරිම වංචාව නෙ. ළමයි මට දෙනවයි කියලා අඟවලා උන්ට ඉගැන්නුවා ගොහිල්ලා හැංගෙන්නයි කියලා. මම හැම තැන ම කිය කිය ඇවිදිනවා, වෙස්සන්තර වගේ බොරුවෙක් මුළු දඹදිව ම නෑ කියලා.

**වෙස්සන්තර** : ටිකක් ඉවසන්න, බමුණ, කරුණු දන්නේ නැතිව කතා කරන්න එපා. මං ළමයින්ට ඉගැන්නුවේ නෑ හැංගෙන්න. ඕන නම් උන්ගෙන් අහලා බලන්න බැරියැ ? උන් පලා ගොස් තියෙන්නේ ඔබේ රළු විලාසයට බය වෙලයි. මම ඉක්මනින් ම ගෙන්න ගන්නම්. (හඬ නගා) පුතා, ජාලිය! මෙහේ එන්න. ක්‍රිෂ්ණජිනා! කොහේ ද නුඹලා දෙන්නා ? ඇහෙන්නෙ නැද්ද මං අඬගහනවා ? අම්මා කිව්වා නේද පේන තෙක් මානෙක ඉන්න කියලා ? එන්න ඉක්මනින්, හොඳ ළමයි වගේ. පුතා නැද්ද මං කියන එක ඇහෙන්නෙ ? අම්මා නැති අතර අකීකරු පුත්‍රයෙක් වුණා ද ? මං කියන්නං කො අම්මා ආවම (ජූජකයාට) මම ගොහිල්ලා හොයාගෙන එන්නම්. එනකල් ඔහොම ඉන්න. (නික්ම යයි.)

**ජූජකයා** : (තමාට ම) බොරුවක් කියලා මයි කියන්න ඕන. එතකොට ලැජ්ජා හිතිලවත් දරුවො නොදේවිය. උන් නං පැනලා ගොහිං තමයි. කොහේ හරි හැංගිලා ඇති. මහ එපා කරපු එවුන්. ලේසියෙන් හසුරවන්න ඇහැක් වෙන්නෙ නෑ. මං දන්නවා හදලා ගන්න හැටි මගේ අතට අහු වුණ දාට. ගහන්න ඕන. ගහන්නේ නැතුව දරුවො හදන්න බෑ. අපි උන්ට ගහන්නේ ආදරේට නෙ ......... (වටපිට බලා) එකත් එකට, ප්‍රමාද වෙන්නෙ දරුවො ඇරන් ගිහිල්ල ද දන්නෙ නෑ. මට මෙහෙන් ඉන්නයි කියලා.

# 4 ජවනිකාව

**(මන්ද්‍රි දේවිය, වනයෙහි)**

**මන්ද්‍රි** : අද මට මොනවා වෙලා ද දන්නෙ නෑ. පලවැල නෙළන්න හිතක් නෑ. බලන බලන අත මට පේන්නෙ පලවැල නො වේ. මගේ දරුවන්ගෙ දුක්බර මුහුණු. උන් අඬනවා වගේ මට ඇහෙනවා හැම පැත්තෙන් ම මගෙ අතින් පිරිවැස්ස වැටෙනවා නිතර ම. හරියට කවුරු හරි කියනවා වගේ ආපහු යන්න කියලා, ඔය පලවැල නෙළුවා ඇතියි කියලා. ඊයෙ මම අර තරම් නපුරු හීනයක් දැකලත් ළමයි දාලා ආපු එක නේ කාරණාව. මට ඉන්න තිබුණ පන්සලේ, නැත්නම් දරුවො දෙන්නව එක්කං එන්න තිබුණා. අනේ මං කරපු මෝඩකමක හැටි.
(පිරිවැස්ස පරීක්ෂා කරමින්)

අදට ඇති මේ නෙළාපු හරිය. මං හනික යන්න ඕන මගෙ ළමයි ගාවට .................... මට යන්නත් බැරි පාටයි. මගේ දෙපය වාරු නැතුව වගේ. මොක ද මේ? මට පාර වැරදිලාවත් ද? ඇයි මේ වන මෘගයා මට යන්න ඉඩ දෙන්නෙ නැත්තෙ ? ඇයි මේ මා වටකරගෙන ඉන්නෙ මෙහෙම ? වෙන දා වගේ නෙමේ, ඉතා රෞද්‍ර විලාසයෙන් මා දිහා රවාගෙන ඉන්නවා. කවදාවත් මෙහෙම දෙයක් වුණේ නෑ මට.

(ගයමින්)

වනන්තරේ රජ කරනා සිවුපාවුනි
දයා ඇසින් බලනුය මා දෙස මෙවෙලේ
ගැහැනියක්මි තනි වී ඇති ඔබ විජිතේ
වල්මත් වී හසරක් නොපෙනේ යන්නට
මා දරුවන් වෙත පෙරමඟ බලා සිටින
කිම් ද හෙළන්නේ රුදු බැලුම් මදෙස
නොම හඳුනන්නකු හමු වූවා සේ
නොවිසූවෙමු ද ළෙන්ගතුව නොමඳ කල්
ඔබ පැටවුන් මා දරුවන් සමගින්
කෙළනා සැටි දැක වඩා සිත සෙනේ ?
පිළිමල් වන්නට කාරණ කිම්ද මෙසේ ?
මඟ අවුරා නොහිඳිනු මැන
අසපුව වෙත පෙරළා යන සැටි කියන්නඃ
ළඟි ළඟියේ ගොස් පෙරටුව
දරුවන් හට දන්වනු මැන
එන වග මා නො වී පමා.

## 5 ජවනිකාව

**(හතරැස් පොකුණ : ජාලිය හා කෘෂ්ණජිනා දියෙහි ගිලී නෙළුම් පතක් යට සැඟවී සිටිති.)**

ජාලිය : අප්පච්චි අඬගහනවා නේ ද නංගියෙ ? අපි නොගිහින් ඉන්න එක හොඳ නෑ.

කෘෂ්ණා : ගියොත් අපි ව අර යකාට දේවි, අයියෙ. අම්ම එන කල් අපි හැංගිලා ඉඳිමු.

ජාලිය : අප්පච්චි අඬහගන කොට අපි කොහොම ද නෑහුණා වගේ ඉන්නෙ? අම්මා කිව්වා නෙ අපට අප්පච්චි පේන තෙක් මානෙක ඉන්න කියලා.

කෘෂ්ණා : අම්මා හිතුවය අප්පච්චි අපට මෙහෙම දෙයක් කරාවි යි කියලා ?

ජාලිය : නෑ නංගියෙ. අප්පච්චි ඇත්තට ම අපි ව දෙන්න නෙවේ. මේ බමුණගෙන් බේරෙන්න විදියක් නැතුවයි ඔහොම කියන්නෙ.

කෘෂ්ණා : ඔන්න අප්පච්චි එනවා අපි ව හොයා ගෙන. ගිලෙන්න අයියෙ වතුරේ. නැත්නම් අපිව දකීවි. ඔය නෙළුම් කොළෙන් මූණ වහගන්න. (වෙස්සන්තර රජ පිවිසේ.)

වෙස්සන්තර : ජාලිය පුතේ! දුව කෘෂ්ණජිනා! අප්පච්චිට ඇයි ඔහොම කරන්නෙ? මෙච්චර අඬගහනවා ඇහෙන්නෙ නැතුවා වගේ ඉන්නෙ? (නික්ම යයි)

කෘෂ්ණා : අප්පච්චිගෙ ඇස් දෙක අමුතුයි. මට හිතෙනවා වෙන කෙනෙක් වත් ද කියලත්. මට බයයි. අයියා යන්න.

ජාලිය : අප්පච්චි අපිව දෙන්නේ නෑ නංගී. මොන හිතකින් ද එහෙම දෙයක් කරන්නේ? අපි පිංසෙණ්ඩු වෙලා කිව්වම දුක හිතේවි.

කෘෂ්ණා : අප්පච්චිට යක්ෂයෙක් ආවේස වෙලාවත් ද? වෙන දා අපට කොච්චර කරුණාවන්ත ද? හදිසියෙන් මෙහෙ ම වෙනස් වුණේ ඇයි?

ජාලිය : (පොකුණෙන් ගොඩ එමින් සහෝදරියට අත දෙයි. එන්න නංගියෙ, අපි යමු. මට නං බෑ අප්පච්චිගෙ හිත රිද්දන්න මේ තරමට. බමුණට දෙන්න හැදුවොත් අපි ආයෙමත් පැනලා යමු. උන්දෑ නාකියි. අපි ව අල්ලන්න බෑ. (ජාලිය තම සොහොයුරිය අතින් ඇදගෙන වරක් පරිෂ්ක්‍රමණය කරයි. ඉක්බිති වෙස්සන්තර රජ පිවිසේ.)

වෙස්සන්තර : මේ එන්නෙ. කොහේද මෙච්චර වෙලා හිටියෙ? මේ ඇඟ ඔක්කොම තෙමිල නෙ. පොකුණට බැස්සද? මේ ළමයින්ගෙ හිතුවක්කාරකමක මහත! අම්මට විතරයි කීකරු වෙන්නෙ, නේ ද? අප්පච්චි කියන දෙයක් අහන්නෙ නෑ. අප්පච්චි සැර වැර කරන්නෙ නෑ නෙ.

ජාලිය : අනේ අප්පච්චි අපිව දෙන්න එපා මේ මිනිහට. බලන්න මූණෙ හැටි. කොච්චර නපුරුද! එයා අපට තළලා දස වද දේවි. අප්පච්චිට දුක නැද්ද අපිව එහෙම අමනුස්සයකුට දෙන්න.

වෙස්සන්තර : පෙනුම එහෙම වුණාට පුතේ, ඒ හොඳ කරුණාවන්ත බ්‍රාහ්මණයෙක්. උඹලව දැකලා ආදරේ හිතිලයි උඹලව ඉල්ලුවෙ හදාගන්නෙයි කියලා. උඹලව හොඳට බලා කියා ගනීවි. උඹලට මොන සැපතක් ද මේ වනාන්තරේ (ජූජකයා පිවිසේ)

ජූජක : ඔබතුමා මෙහේ ද? මං හිතුවෙ දරුවො දෙන්නත් එක්ක යන්න ඇතියි කියලා මාව මග ඇරලා.

වෙස්සන්තර : මෙන්න දරුවො අරන් යන්න. (දරුවන්ගේ අත් ගෙන ජූජකයාගේ අත පිට තබා කෙණ්ඩියෙන් අත පැන් වත්කොට දරුවන් දෙයි.)

දෙදෙනා : (ගයමින්) අම්මා එනතුරු නොදෙන්න පාවා
අප මේ නැබල යකාට බිහිසුණු
වලට යන වේලේ ඇ බිණූ බස්
සිහි නැති වී ද පියාණෙනි මෙවිගස ?
පෙරළා පැමිණ අප නුදුටු විට ඈ
කෙලෙස ද වාවාගන්නේ වියෝව
ළය පැළී මිය නොයා ද එකෙණෙහි ම?

කෘෂ්ණා : පියාණෙනි අප කිනම් වරදක්
කළ නිසාදෝ මෙවන් දරුණු වූ
දඬුවමක් අප හට දෙවන්නේ ?
අකීකරු වූ ලෙසක් පෙනුණි ද
හුන් නිසා සැඟවී එවේලේ
දැක මෙබමුණගෙ මුහුණ බියකරු ?

වෙස්සන්තර : මා දරුවන්ගේ දුක් ගැනවිලි හඬ
සිරුරේ සම් මස් නහර සිඳුරු කොට
ඇට මිඳුලු තුළට වදී විෂ කැවුණු
හීයක් සේ දුක් දෙවමින් අපමණ
බොළඳ වියෙහි සිටිනා උන් කෙලෙස ද
මා කරනා දේ වටහා ගන්නේ ?

මා සතු වූ අන් හැම වස්තුව ම
දුනිමි ආලය නො වී බිඳකුදු

මහට දා වූ සිඟිත්තන් වෙත
බැඳුණු ආලය අබිබවන්නට
ලෝ සතන් වෙත මගේ ප්‍රේමය
නැඟී විත් සිය දහස් ගුණයෙන්
පිහිට වේවා මෙමොහොතේ මට

බමුණ බාරගනු දරුවන් නොලස ම
සංසිඳවා ගනු මනදොළ ඔබගේ
ආදර තුරුළුවෙ හදා වඩාගත්
උන්හට නැත අප පරුස විලස් පා
දෙමාපියන්ගෙන් වූ මේ වියෝව
දැනෙන්ට නොහරිනු උන්හට කිසි විට

**ජාලිය** : නොහැකි නම් කන් දෙන්න අපේ මේ අයදුමට
මා දෙන්න බමුණාට දෙන්නෙපා නැඟණියන්
නැඟණියෝ මොළකැටියි

අම්ම නැති කාන්සිය ඈට බෑ ඉවසන්න
ඇඟ දිරා යයි ඇගේ නොකා ඉඳ හාමතේ
මා දෙන්න බමුණාට දෙන්නෙපා නැඟණියන්
මා නැතත් අපෙ අම්මා සැනසේවි දුටුවාම නංගී පොඩි
මඳක් වත් නිවී යයි ඇගේ හද තුළ ගින්න

(මේ අතරතුර රංග භූමියෙන් නික්ම යන ජූජක බමුණා ඉපලක් ඇරගෙන ආපහු අවුත් දරුව න් අල්ලාගෙන උන්ට තළා පෙළා හඬව හඬවා ගෙන යයි. වෙස්සන්තර රජ ශෝකයෙන් තැවෙමින් ළමයින් දෙස බලා හිඳී. ඉක්බිති ඔහු සංවේගයෙන් නැඟී සිටී.)

**වෙස්සන්තර** : බමුණා කීයේ මුසා බසක් වන
දරුවන් කෙරෙහි උපන් ආලයෙනැයි
හදා වඩා ගනු වස් උන් ඉල්ලුවෙ
මහා කුරිරු සිත් ඇත්තෙකු විය යුතු
ළපටි නොදරුවන් තළන්ට මෙඅයුරු
වහල් මෙහෙ පිණිස කුඩාවුන් සොයා
ආ මිනිසකු වන කෛරාටික වූ
රොස් පරොස් බසක් කිසි විට නොඇසූ
දරු දෙදෙන කෙලෙස ද ඉවසන්නේ
මේ රකුසාගේ ඉපල් පහර දැඩි
ලේ සල්වා වැටෙනා උන් පිට මත ?
මා අබියස ඔහු මෙඅයුරු වේ නම්
ඉවතට ගිය කල කුමක් නොකරයි ද!

මගේ ම ඕරස දරුවෝ නොවෙත් ද
මේ හිංසාවට භාජන වන්නේ ?
බලා සිටින්නේ කෙලෙස ද ඉවසා
සිත් පිත් නැත්තෙකු විලසට නොසැලී ?
යා යුතු ය මේ විගස මුදවන්ට මදරුවන්
බැඳ තබමි බමුණු සොර සිටිය හොත් පිළිමල් ව
ආ කලට මා දේවි කෙලෙස සනසම් ද ඈ ?
දරු දෙදෙන රැක බලා ගන්නෙමැයි දුන් පිළින
කඩ කළේ ඇයි කියා ඇසූ කල
කවර පිළිතුරු දෙම් ද?
පොළෝ තල මත වැටී හඬා වැලපේ ය ඈ
නොදක දරු දෙදෙනාගේ වත සොඳුරු
සවන් නොකර උන්ගේ හඬ මියුරු
නොරැඳේය ඇසිල්ලක් ඇගෙ ජීවිතය දුබල
යම් සෙදින මේ මොහොතෙ මුදවන්නට ම දරුවන්
ගෙන ඇවිත් මා වෙතට තබාගෙන උකුල මත
සනසන්නට මුදු බසින් ඔද්දල් වූ සිත් සතන්
සෝදන්නට ඔසු දියෙන් පැළී ඇති සම පිටේ
(ලහි ලහියේ එක් වරක් පරිශ්ක්‍රමණය කොට නික්ම යයි.
ඉක්බිති ජූජකයා දරුවන්ට තළමින් පිවිසේ.)

දරුවෝ : (ගයමින්) දූන් දූන් අම්මා ඒවි සිතමින්
බලා හුනිමු අපි මෙදුකින් මිදෙන්නට
නාවොත් මැනවයි සිතේය දූන් නම්
අප විඳිනා දුක් පීඩා බලන්ට
තුන් සිතකින් වත් සිතුව ද අම්මා
පලවැල නෙළන්ට ගිය ඒ වේලේ
පෙරළා ආ විට පලවැල අරගෙන
දෑසට දකින්නට නොලැබෙන වග අප
(නික්ම යයි. රජ පිවිසේ)

**වෙස්සන්තර** : පවිටු චේතනාවකි මා සිතට පිවිසුණේ එකෙණෙහි
දන් දුන්නු දේ වරක් නැවත ඉල්වීම නම්
මහඟු ගුණයක් නො වේ
පෙර බුදු වූ උත්තමයන්
පංච මහා පරිත්‍යාග කොට නො වේ ද බුදු වූයේ ?
පුත්‍රදාරා පරිත්‍යාගය උත්තරීතර මංගල්‍ය වේ
පුහුදුන් මිනිසෙකුට දුෂ්කර වූ
ඒද කෙළෙම් මම
ඒ පිනින් මම කෙලෙස් දුරු කොට
ගෙවා සව්නේ දන නිමාවට
ලොව්තුරා බුදු බව ලබන්නෙමි

## ක්‍රියාකාරකම 01

i. රචකයා මන්ද්‍රී දේවිය දරුවන් කෙරෙහි දක්වන ආදරය මතු කර පෙන්වන අවස්ථා තුනක් සඳහන් කරන්න.
ii. ජූජක බමුණා වනාන්තරයට පිවිසියේ කුමන අරමුණකින් ද?
iii. ජූජක බමුණා සහ වෙස්සන්තර රජතුමා අතර ඇති වූ දෙබස කතාවක අවස්ථාවක් ලෙස ලියා දක්වන්න.
iv. වෙස්සන්තර රජතුමාගේ දාන පාරමිතාව හා දරුවන්ට ඇති ආදරය යන දෙකරුණ රචකයා ඉදිරිපත් කරන්නේ කෙසේ ද?
v. වෙස්සන්තර රජතුමා තම බිරිඳට හා දරුවන්ට දක්වන ආදරය ප්‍රකාශ කරන ගීත ඛණ්ඩයක් නාට්‍ය පෙළින් උපුටා දක්වන්න.
vi. මෙහි දැක්වෙන චරිත අතුරෙන් ඔබ සිත් ගත් චරිතය කුමක්දැ 'යි දක්වා එයට හේතු ඉදිරිපත් කරන්න.
vii. වංකගිරි අරණේ සුන්දරත්වය, නාට්‍ය පෙළ ඇසුරින් විස්තර කරන්න.
viii. පහත සඳහන් ප්‍රකාශ කවරෙකු විසින් කවරෙකුහට කුමන අවස්ථාවක දී ප්‍රකාශ කරන ලද්දේදැ 'යි දක්වන්න.

❖ නෑ මම යන්නෙ නෑ ඈත. මම එනවා වෙනදාටත් වැඩිය කලියෙන්.
❖ අප විසින් කරන ලද මහත් පින් රැසක් පලදුන් දසාවක් ලෙස අපට පෙනෙනවා.
❖ පින්වත් බමුණ ඔබ කියන එක දේකින් වත් අපට දුකක් නෑ දානෙන් අඩුවක් නෑ
❖ දරුවෙක් කිව්වම මවකට පියෙකුට තියෙන ලොකුම වස්තුව නෙ
❖ එලවගෙන ආවා වෙන්න බෑ. උඹලට ආදරේට වඩා ගන්න හදන්න ඇති.

## ක්‍රියාකාරකම 02

**01. පහත සඳහන් පදවල අරුත් පැහැදිලි වන සේ වාක්‍යය බැගින් තනන්න.**

i. පිතෘ ප්‍රේමය
ii. පිළිසඳර
iii. අප්‍රමාණ සැනසීම
iv. රොස් පරොස් බසක්
v. ජනශූන්‍ය ප්‍රදේශය

## ක්‍රියාකාරකම 03

**පහත දැක්වෙන වාක්‍ය කොටස්වල ඉරි ඇඳි පදවලට සමානාර්ථ පද ලියන්න.**

i. <u>නෑ සියෝ</u> නොමැත මේ කතරේ මට
ii. උඹට <u>තිබහ</u> නං උඹ අම්මගෙන් කිරි බෝව්

iii. ඒකෙන් ඒ තැනැත්තාගේ දොළ සංසිඳෙනවා
iv. මගෙ අතින් පිරිවැස්ස වැටෙනවා
v. පිළිමල් වන්නට කාරණ කිම් ද මෙසේ

## ක්‍රියාකාරකම 04

*  **වංකගිරි අරණේ බොහෝ සත්තු ඇත.**

ඉහත සඳහන් වාක්‍යයේ ආඛ්‍යාතය වෙනුවට "ඇත" යන්න යෙදී ඇත. එම වාක්‍යයේ කර්තෘ උක්ත රූපයෙන් යෙදේ. එහෙත් එබඳු වාක්‍යයක භාවක්‍රියා පදයක් (පැමිණ, සැඟවී) යෙදුණු විට කර්තෘ අනුක්ත වේ.

**නිදසුන්**
කාර්යාලයට ලිපිකරුවන් පැමිණ නැත.
මේ වාක්‍ය රීතිය පිළිබඳ සැලකිලිමත් ව පහත ඉදිරිපත් කරන අභ්‍යාසයේ නියැලෙන්න.

පහත සඳහන් වාක්‍යවල හිස්තැන් සම්පූර්ණ කරන්න.

i. දුම්රියේ බොහෝ මඟීහු ..............................
ii. දේශනයට සවන් දීම සඳහා බොහෝ ප්‍රේක්ෂකයන් ...............................
iii. රෝහලේ ............................... ඇත.
iv. අපේ ගෙදරට ................................ පැමිණ ඇත.
v. ක්‍රීඩා පිටියට බොහෝ විදුහල්වලින් තරගකරුවන් ............................
vi. අද රැස්වීමට බොහෝ ................................ පැමිණ නැත.

මේ වාක්‍යය කියවන්න.

වැරදිකරුවෝ හිර අඩස්සියේ

මෙහි ආඛ්‍යාතයක් නො පෙනේ. එහෙත් එය ආධ්‍යාහාරයෙන් ගත හොත් "පසුවෙති" යනුවෙන් බහුවචන ආඛ්‍යාතයක් ඉස්මතු වෙයි. මෙය ද සිංහල භාෂාවේ විශේෂ වාක්‍ය රීතියකි.

නිදසුන්:-

i. විත්තිකරුවෝ නිදහස්
ii. මෝටර් රථය පාරෙන් ඉවතට
iii. අපි හොඳ මිනිස්සු

## පැවරුම්

01. මේ නාට්‍ය පෙළ නාට්‍යෝචිත ආකාරයට සංවාද ස්වරූපයෙන් කියවන්න.

02. මේ නාට්‍යයෙන් තෝරා ගත් කොටසක් රඟ දක්වන්න.

03. පාඩමට අයත් නාට්‍ය පෙළ ඇසුරින් චිත්‍රයක් නිර්මාණය කරන්න.

04. ඔබ කැමති ජනකතාවක් හෝ වෙනත් කතාවක් ඇසුරින් කෙටි නාට්‍යයක් ලියන්න.

05. වෙස්සන්තර ජාතක කතාව ඇසුරෙන් නිර්මාණය කර ඇති කවි ගීත නිර්මාණ එකතුවක් සකස් කරන්න.

06. ඔබ වෙස්සන්තර රජතුමා යැයි සිතා රජකම අතහැර වනයට පැමිණීමෙන් පසු වෙස්සන්තර රජතුමාගේ සිතට ආ සිතිවිලි ඇසුරින් නිර්මාණාත්මක රචනයක් ලියන්න.